# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 අගෝස්තු 28** වන සඳුදා
2017 ஆவணி 28 திங்கட் கிழமை
Monday 28th August 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා.** 10.11 **ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 10.11 க்கு சபை கூடியது*
*The Provincial Council met at 10.11 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් වීමෙන් පසු ඊළඟ පළාත් සභා රැස්වීම් දිනය වන්නේ 2017.09.04 සඳුදා දිනය බව ගරු මන්ත්‍රීවරුන් වෙත නැවතත් මම කාරුණිකව දැනුම් දෙනවා.*

*ii*

*2017.08.22 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී මෙන්ම සභා රැස්වීමේදී එකඟතාවය පළ වූ පරිදි අද දින සභාවේ වැඩ කටයුතු ප්‍රධාන වශයෙන් පොදු කටයුතු විෂයයට පමණක් සීමා වන පරිදි කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත කාරුණිකව දැනුම් දෙනවා.*

*එම නිසා අද දින න්‍යාය පත්‍රයට ප්‍රශ්න හා පෞද්ගලික පැහැදිලි කිරීම් යන විෂයයන් ඇතුළත් නොවන බව ද කාරුණිකව දැනුම් දෙනවා.*

ලිපි ලේඛන පිළිගැන්වීම යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට හෝ එතුමා වෙනුවෙන් වෙනත් ගරු අමාත්‍යවරයෙකුට අවස්ථාව ලබා දෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත සභාවට පිළිගැන්වීමට.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙම කාරණාව පිළිබඳව තව දුරටත් සාකච්ඡා කරන්න තිබෙනවා. එම නිසා පක්ෂ නායක රැස්වීමක් පැවැත්වීම සඳහා විනාඩි 15 ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.


**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් මා වෙත කරන ලද ඉල්ලීම අනුව, මෙම සභාව මම විනාඩි 15 කට කල් තබනවා. ඊට පෙරාතුව මම සියලුම පක්ෂ නායකයින්ට ආරාධනා කරනවා, මගේ නිල කාමරයට පැමිණෙන්න කියලා. ඒ අනුව මම විනාඩි 15 කට සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 10.46 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 10.46 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි නැවත වරක් න්‍යාය පත්‍රයට යමු. න්‍යාය පත්‍රයේ ලිපි ලේඛන පිළිගැන්වීමේ විෂය යටතේ මම කථා කරන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම ආරාධනා කළා, එම අවස්ථාවේදී ලිපි ලේඛන පිළිගැන්වීම යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත පිළිගැන්වීමට. ඒ අවස්ථාවේදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා මට යෝජනාවක් ඉදිරිපත් කළා. මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා පළාත් සභාව තුළ සිටින කණ්ඩායම් නායකයින්ගේ රැස්වීමක් කැඳවන්නය කියලා. ඒ අනුව මම විනාඩි 15 කට සභාව කල් තබලා, සියලුම පක්ෂ නායකයින්ගේ රැස්වීමක් පැවැත්වුණා. මම ඒ තීන්දුව ප්‍රකාශ කිරීමට පෙරාතුව ගරු ආණ්ඩුකාරතුමා මා වෙත එවන ලද ලිපිය නැවත වරක් මම ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා.


දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 0112334371, 0112334088
ෆැක්ස් / தொலைநகல் / Fax 0112334370
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail governor@governor.wpc.gov.lk

කේ. සී. ලෝගේස්වරන්
கே. சி. லோகேஸ்வரன்
K. C. Logeswaran
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර
மேல் மாகாண ஆளுநர்
Governor, Western Province

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, 5 වන මහල, රොටුන්ඩා ගොඩනැගිල්ල, අංක 109, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
ஆளுநர் செயலாளர் பணிமனை, 5ம் மாடி, ரொட்டுண்டா கோபுரம், இல. 109, காலி வீதி, கொழும்பு 03, இலங்கை.
Secretariat of the Governor, Level 05, Rotunda Tower, No. 109, Galle Road, Colombo 03, Sri Lanka.

මගේ අංකය: GOS/LEG/නීති කටයුතු මිශ්‍ර

දිනය: 2017.08. 18

ගරු සභාපතිතුමා,
බස්නාහිර පළාත් සභාව.

ගරු සභාපතිතුමනි,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් එවන ලද අංක CSA/9/9/6 හා 2017.08.17 දිනැති ලිපියේ පිටපතක් සහ භාෂාත්‍රයෙන් සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතෙහි පිටපතක්, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ඇ ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාව යටතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම පිණිස මේ සමග එවමි.

02. එම පනත් කෙටුම්පත බස්නාහිර පළාත් සභාව වෙත ඉදිරිපත් කර පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීමට හැකි වන පරිදි අද දින සිට දින 12ක් ඇතුලත මා වෙත එවන මෙන් කාරුණිකව දන්වමි.

මෙයට-හිතවත්

කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර(බස්නාහිර පළාත)

එතකොට මේ ආණ්ඩුකාරතුමා එවපු මේ ලිපිය අනුව අපි සභා කටයුතු කාරක සභා රැස්වීමේදී (බාධා කිරීම්) සභා කටයුතු කාරක සභාවේදී සහ මෙම ගරු සභාවේදී අපි රැස්වී එකඟතාවයට පත් වුණා, ආණ්ඩුකාරතුමාගේ ලිපියට අපි එකඟතාවය පළ කිරීම සඳහා. අපි අද දින මෙම සභාව පවත්වන්න අවශ්‍යයි කියන කාරණාව පිළිබඳව. එයට හේතුව තමයි, හෙට දිනයට තමයි දින 12 සම්පූර්ණ වන්නේ. ඒ නිසයි අපි අද මේ සභාව විශේෂ සභාවක් වශයෙන් හදිසියේ කැඳෙව්වේ. අපි න්‍යාය පත්‍රයේ තිබුණු අනිකුත් සියලුම කාරණා අයින් කළා. පෞද්ගලික පැහැදිලි කිරීම් අයින් කරලා තමයි අද විශේෂ සභාවක් වශයෙන් මේ සභාව රැස් කළේ. ඒ අතරතුරේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මගෙන් ඉල්ලීමක් කළා, සියලුම පක්ෂ නායකයින්ගේ රැස්වීමක් කැඳවලා මේ පිළිබඳව ඒ අයගේ මතය විමසන්න කියලා. විශේෂයෙන් සභාපතිවරයා වශයෙන් මම එක්කෝ ගරු ආණ්ඩුකාරතුමාගේ ඒ ලිපිය අනුව හෙට දවසට කලින් මේ පිළිබඳව එතුමාව ලිඛිතව දැනුවත් කරන්න ඕනෑ. අනික් පැත්තෙන් පළාත් සභාවේ ගරු මහ ඇමතිතුමාත් එක්ක කරන ලද එකඟතාවය අනුව පක්ෂ නායකයින්ගේ තීරණයක් ආවා - මම ඒක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. පක්ෂ නායකයින් තීරණය කළා, සභාවේ එකඟතාවය මත මෙම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සාකච්ඡා කිරීම කල් දාන්න ඕනෑය කියලා. එතැනදී එවැනි මතයක් තමයි ඉදිරිපත් වුණේ. හැබැයි, අපි ඒ කල් දාන එක තීන්දු කරන්න ඕනෑ සභාවේ එකඟතාවය මතයි. ගරු මහ ඇමතිතුමා මම හරි නේද? සියලුම කණ්ඩායම් නායකයින්ගේ ආපු එකඟතාවය. තීන්දුව ආවේ ඒකයි. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමා මා වෙත කරන ලද ඉල්ලීම අනුව -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන්නේ අවසාන එකඟතාවය. අවසානයෙන් ආපු එකඟතාවය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ කියන්නේ, ඔබතුමා මෙක හරියට පැහැදිලි කරන්න නම්, පක්ෂ නායකයින් හැටියට අපි දක්වපු අදහස් සම්බන්ධව සාරාංශයක් ඉදිරිපත් කරන්න. එහෙම නැත්නම් මෙතැනට යන්න පුළුවන්. අපිත් ඒ එකඟතාවයේ මුල ඉඳන්ම හිටියාය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම එතැනට එන්නේ. මොහොතකට කලින් පක්ෂ නායක රැස්වීමේදී දැන් තීන්දු කළා නේ? මහ ඇමතිතුමා සම්බන්ධ වුණා. විපක්ෂ නායකතුමා සහභාගී වුණා. ඊළඟට අනෙක් සුළු පක්ෂවලින් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමා සහභාගී වුණා. ඒ අය තමයි තීන්දු කළේ, කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව කල් තබන්න නම් සභාවේ මතය විමසා, එකඟතාවයක් ගන්නය කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි ඉදිරිපත් කළේ ඒක නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී කථා කළේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් මට සිද්ධ වෙනවා - මේ පනත් කෙටුම්පත ගන්න ඉස්සෙල්ලා කණ්ඩායම් රැස්වීමේ තීන්දුව ක්‍රියාත්මක කරන්න එපැයි. අවශ්‍ය නැද්ද? එහෙම නම් මේ අවස්ථාවේදී - (බාධා කිරීම්) මම ඒකයි තීන්දු කළේ. ඒ සාකච්ඡාවේ සාරාංශය තමයි ප්‍රකාශ කළේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පක්ෂ නායක රැස්වීමේ සාරාංශය ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉදිරිපත් කළේ සාරාංශය තමයි. එහිදී තීරණය කළා, මේ පිළිබඳව සභාවේ එකඟතාවය ගන්නය කියලා. සභාව කල් දානවාද නැද්ද කියලා. එහෙම නම් ගරු ප්‍රධාන අමාත්‍යතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. ඒකට ඔබතුමා ඡන්දයක් විමසන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, එළැඹෙන තත්ත්වයන් පිළිබඳව පූර්ණ ලෙස අවධානය යොමු කරපු මා බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට ඔබතුමා සමඟ එකඟ වෙමින් අද දින සභාව රැස් වුවත්, මේ එවලා තිබෙන අලුත් ව්‍යවස්ථාව සම්බන්ධයෙන් තවත් අපට දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න තිබෙනවා. අපේ සංශෝධනත් ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ පිළිබඳව රජයේත් අවධානය යොමු වෙලා තිබෙන බව අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා. ඒ අනුව, මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, *"අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුකාරතුමා මගින් මෙම පළාත් සභාවේ අදහස් විමසා එවා ඇති විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නම් වූ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය, අද දින විවාද නොකර වෙනත් දිනයකදී විවාදයට ගැනීමට අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා."*

ගරු ආණ්ඩුකාරතුමාත් සමඟ මේ සම්බන්ධයෙන් කථා කළා. මම ආණ්ඩුකාරතුමා ගෙන් දින 14 ක් ඉල්ලුවා. ගරු ආණ්ඩුකාරතුමා මට කිව්වා, ඔබතුමා විසින් කරන ලද ඉල්ලීමට අනුව ජනාධිපති ලේකම්තුමාට ඒ බව දැනුම් දුන්නා. ජනාධිපති ලේකම්තුමා දින 14 ක් බස්නාහිර පළාත් සභාවට දෙන්නට එකඟ වුණු බැවින්, ඒ අනුව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් ඉතාමත්ම වගකීමෙන් මම ඉල්ලා සිටිනවා. අපට ඊළඟ සභාව තෙක් මේ කෙටුම්පත පිළිබඳ විවාදය කල් තබන්න ඉඩ දෙන්නය කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව අපගේ එකඟතාවයක් නැහැ. ඊළඟ සභාව තෙක් කල් තියනවාට. එහෙම නම් සභාවේ එකඟතාවය අරගෙන, ඡන්දයකට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපටත් ඔබතුමාගෙන් මේක පැහැදිලි කර ගන්න අත්‍යවශ්‍යයි. ඔබතුමා මේ ලිපිය කියෙව්වා. හෙට දිනයට දින 12 ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සම්පූර්ණ වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්පූර්ණ වෙනවා. එතකොට මොන නීතිය යටතේද මේ සභාව දැන් ගියවර සභාව වෙලාවේදී දිනයක් නියම කරලා, වෙලාවක් නියම කරලා, කැඳවලා අද මොන නීතිය යටතේද මේ සභාව කල් දාන්න යන්නේ. දින 12 හෙට ඉවර නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපට ඒක කියවන්න හම්බ වුණෙත් නැහැ. මේ සම්බන්ධව උපදේශකයන්ගෙන් උපදෙස් ගන්න ඕනැ. නීති උපදෙස් ගන්න ඕනැ. කථා කරන්න නීති උපදෙස් ගන්න ඕනැ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

නීත්‍යානුකූල වංලගුභාවයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභාවට මම ගරු කරනවා. එහෙම නම් මට ගරු සභාවේ එකඟතාවය ඉදිරිපත් කරන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, එහෙම නම් ඔබතුමා කරපු යෝජනාවම වැරදියි නේ?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මේක තව තවත් කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. දැන් මේ පක්ෂයෙන් ඉදිරිපත් කළා නේ අදහසක්. ඒ අනුව තමුන්නාන්සේට කටයුතු කරන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දැන් සිද්ධ වෙනවා, එකඟතාවය විමසන්න. මතය විමසන්න. කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මතය විමසන්න. මේක කල් දදා ඉන්න ඕනැ නැහැ. ගරු සභාපතිතුමනි, මතය විමසමු. ඡන්දයකට යමු.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කල් දාන්නේ මොකටද? කල් දාන්නේ ඇයි?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කල් දමන්නේ මොකටද?

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, සභාවේ මතයක් විමසුවාට වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කල් දාන්නේ නැහැ. කල් දාන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඡන්දය විමසන්න. කල් දාන්න බැහැ. ගරු සභාපතිතුමනි, අද ඔක්කොම සභාවේ ඉන්නවා. මතය විමසන්න.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

හෙටින් පස්සේ කාලය ඉවරයි නම්, කල් දැම්මාය කියලා වැඩක් නැහැ නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අද ඔක්කොම සභාවේ ඉන්නවා. ඡන්දය විමසන්න. කල් දාන්න එපා. ඡන්දය විමසන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උතුරු මැදයි උතුරෙයි ඉවරයි. එහෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි කල් දාන්නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

18 වන සංශෝධනය කරපු හැටි. 18 වන සංශෝධනය වාගේ මේවා කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමිය කථා කරන්න මම කථා කළාට පස්සේ. හැම එහෙකටම කෑ ගහන්න එපා. කට තිබ්බට හැම එහෙකටම කෑ ගහන්න යන්න එපා. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමිය නැඟිටලා වෙලාවක් ඉල්ලගෙන කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේක අයවැයටත් වඩා භයානක යෝජනාවක්. මේක ආයෙත් මුළු පළාත් සභා ඉතිහාසයටම බලපානවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අද වෙනත් යෝජනා නැතිව මේ යෝජනවා පමණක් අරගෙන මේ පනත සම්මත කරන්න සභාව කැඳෙව්වා නම්, හෙට දිනයේ දින 12 ඉවර නම්, ඇයි නැවතත් මේ සභාව කල් තබන්නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කල් දාන්නේ ඇයි?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කල් දමන්න බැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නායකයෝ මේකට එකඟ වෙලා නැහැ. පක්ෂ නායක රැස්වීමකට විනාඩි 15 කට සභාව කල් දා ගත්තා. පැය භාගයකට වැඩියි මේ වන කොට. ඔබතුමාට ආයිත් - 10.15 ට කල් තිබ්බේ. 10.40 ට ඔබතුමා මෙතැනට ආවේ. පක්ෂ නායක එකඟතාවයක් නැහැ. එහෙම නැති එකක් කොහොමද කල් දාන්නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, තීන්දුව එතැනට යන්න දෙන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ප්‍රශ්නයේදී ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාව වුණේ - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ නායකයාගේ යෝජනාව වුණේ, අද කැමැති නම් ඡන්දයකට යන්න. ඒකේ මතය

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

විමසන්න කියලා. අපිත් කියන්නේ ඒකයි. අපට මේකේ පැරදුණත් එකයි. දිනුවත් එකයි. අපි මේ වාගේ යෝජනාවක් තමයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනාවේ. ඒ නිසා අපි ගරු මහ ඇමතිතුමාගේ යෝජනාවට පුද්ගලිකව ගරු කරමින් එතුමා කියන ඕනෑම කර්තව්‍යයකදී එක්සත් ජාතික පක්ෂය හැටියට අපි සහයෝගය ලබා දෙනවාය කියන එක මම මතක් කරන්න කැමැතියි.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කරන්න අවශ්‍යයි.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු අදහස තමයි අපි අනුමත කරන්නේත්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි එහෙම නැහැ.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් ඩීල් කාරයෝ ඉන්න වෙලාව.

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේකේ තිබෙන නීත්‍යානුකූල තත්ත්වය පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්න අවශ්‍ය වෙනවා. දැන් අතිගරු ජනාධිපතිතුමා - (බාධා කිරීම්) කෑ ගහන්න ඉස්සෙල්ලා අහ ගන්න. (බාධා කිරීම්)

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම කරපු ප්‍රකාශය නීත්‍යානුකූලයි. ඒ සම්බන්ධයෙන් සභාවේ මතය විමසන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නීත්‍යානුකූලභාවය සභාවේ එකඟතාවය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ එකඟතාවය විමසන්න. ඡන්දයක් තියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. සභාපතිවරයා වශයෙන් මටත් යම්කිසි මේ සභාවේ ගරුත්වයක් තිබෙනවා. සභාපතිවරයා වශයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, සභාවේ එකඟතාවයකට ඇවිල්ලා තමයි අද මේ සභාව කැඳෙව්වේ. ඇයි ඒ සභාව දැන් නැවතත් කල් දාන්නේ?

[සභාවේ ඝෝෂා]

ගියවර සභාවේ ඔබතුමා ප්‍රකාශයක් කරලා,

[සභාවේ ඝෝෂා]

මේ කාරණාව ගන්න ඕනෑ නිසා තමයි අද මේ දිනය නියම කළේ. ඇයි අද ඒක කල් දාන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනේ හොඳයි. ප්‍රජාතන්ත්‍රවාදය. වැඩි ඡන්දයට තැන -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කල් දාන්න උවමනාවක් නැහැ නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, කැමැත්ත, අකමැත්ත විමසන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාගේ කර්තව්‍ය කරන්න. ඔබතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි කල් දාන්නේ. කල් දාන්න උවමනාවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම තීන්දුවක් ගන්නේ නැහැ. සභාවේ එකඟතාවය මම ඇහුවේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා ප්‍රකාශ කරලා පක්ෂ නායකයින්ගේ රැස්වීමක් කැඳවලා - සභාව කල් තියන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සභාවේ මතය ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දයකට යමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාවේ මතය බලලා නේ මේ කැඳෙව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාවේ මතය බලලානේ මේ කැඳෙව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ රජය වාගේ තමයි -

[සභාවේ ඝෝෂා]

ජනතාවට තිබෙන අමාරු ගැන වගක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අද මොකක්ද මේ කරන්නේ? මොකක්ද මේ කරන විනාසේ. රටට වෙලා තිබෙන දේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමන්ලා වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ සෙංකෝලය උස්සන්න ලැහැස්ති වෙනවා කණ්ඩායමක්. මේ පළාත් සභාවේ උස්සන්න ලැහැස්ති වෙනවා. කැත වැඩ කරන්න එපා. ඔබතුමා ඡන්දය තියන්න. අපි ඡන්දවලට භය නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ආපහු සභාවේ මතයක් බලන්න දෙයක් නැහැ. අපි විරුද්ධයි. සභාවේ මතය බලනවාට අපි විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කල් දාන්නේ සභාවේ එකඟතාවය මත.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, යෝජනාව ගෙනැල්ලා විවාද කරන්න අවස්ථාව -

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, සභාව කල් තැබීම සඳහා ඡන්ද විමසීමක් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඡන්දයක් තියන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ යෝජනාව විවාදයට අර ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි කල් දානවාට විරුද්ධයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ යෝජනාව විවාදයට අරගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕගොල්ලන්ට ඕනෑ ඕනෑ වෙලාවට අපි ඡන්ද තියන්නේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

යෝජනාව අරගෙන විවාද කරන්න . ඇයි භයේ කල් දාන්න යන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාව අරගෙන විවාද කරන්න. එහෙම කල් දාන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම දැන් සභාවේ එකඟතාවය ඇහුවා නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේක විවාදයට අර ගෙන ඊට පස්සේ ඡන්දයකට යන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සභාපතිතුමා ඩබල් ගේමක් ගහන්නේ. ඔබතුමා ඩබල් ගේමක් ගහන්නේ. ඡන්දය තියන්න. සීනුව නාද කළා. ඔබතුමා ඩබල් ගේමක් ගහන්නේ. ඔබතුමාට කොන්ද පණ තියෙන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමා, න්‍යාය පත්‍රයේ තිබෙන දේ ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට සිද්ධ වෙනවා -

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, කණ්ඩායම් නායකයෝ සාකච්ඡා කරලා ගෙනැල්ලා තිබෙන්නේ. මේක මහා පුදුම විහිළුවක් නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාවට මතයක් විමසන්නේ මොකටද? යෝජනාවට නැවත මතයක් විමසනවාට අපි විරුද්ධයි.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීවරු නිශ්ශබ්ද වන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද - මට සිද්ධ වෙනවා. මම තීන්දු කළේ නැහැ. මම තනි තීන්දුවක් ගත්තේ නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේවා සාකච්ඡා කරලා තමයි ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාවට මතයක් විමසනවාට අපි විරුද්ධයි. යෝජනාවට මතයක් විමසනවාට අපි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පක්ෂ නායක රැස්වීමක් කැඳවලා මේක කල් දාන්න. යෝජනා ගේන්න බැහැ. කොහොමද එහෙම යෝජනා ගේන්නේ? එතුමාට එහෙම යෝජනා ගේන්න බැහැ. මහ ඇමැතිවරයා හැටියට පක්ෂ නායක රැස්වීමක් කැඳවලා මේ සභාව කල් දාන්න යෝජනා ගෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නීතිය අනුව මට සිද්ධ වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොන නීතිය අනුව ද ගේන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

නීතිය මොකක්ද? එහෙම නීතියක් නැහැ. මොන නීතිය යටතේ ද ගේන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ යෝජනාවට අදහස් විමසන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කල් දාන්න මතය විමසන්න ඕනෑ නැහැ නේ? එහෙම නම් හැමදාම සභාව කල් දාන්න පුළුවන් නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාවට අදහස් විමසලා ඡන්දයකට යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දැන් සිද්ධ වෙනවා, සභාවේ එකඟතාවය මත ඡන්දයකට යන්න. මම නොවෙයි තීන්දු කළේ. මම නොවෙයි තීන්දු ගත්තේ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මොකක්ද නීතිය. කල් දාන්නේ කොහොමද?

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඡන්දයක් විමසන්නේ කොහොමද? ඇයි යෝජනාව විවාදයට ගන්නේ නැත්තේ? යෝජනාවට භයද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාව විවාදයට ගන්න. කල් දානවාට අපි විරුද්ධයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි යෝජනාව විවාද කරන්නේ නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් වාඩි වෙන්න. කණ්ඩායම් රැස්වීමේ තීරණය කළේ. කණ්ඩායම් රැස්වීමේදී තීරණය කරපු, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟතාවය මත -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සභාවේ මතය අහන්න එපා. යෝජනාව විවාදයට ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු සභාපතිතුමා තීරණයක් ගන්නවාද? නැත්නම් අපි එළියට යන්නද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. (බාධා කිරීම්) ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට පක්ෂ ගරු මන්ත්‍රීවරු නැගී සිටින්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ වැඩි මතය බලවත්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම කරන්න බැහැ. එහෙම කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි විරුද්ධයි. මැදට යන්න.

***මේ අවස්ථාවේ සභා ගර්භයේ මැදට ගරු මන්ත්‍රීවරුන් පිවිසීම නිසා ඇති වූ නොසන්සුන්තාවය මත සහ සභාවේ සෙංකෝලය ලබා ගැනීමට තැත් කිරීම හේතුවෙන් සෙංකෝලයට හානි සිදු වූ අතර, ගරු සභාපතිතුමාගේ හදිසි දොරටුවෙන් එසේ හානි වූ සෙංකෝලය රැගෙන ගොස් සුරක්ෂිත කර ගැනීමට සිදු විය.***

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඕකනේ කරන්න දැඟලුවේ. කිව්වා නේ කරන්න එපාය කියලා. ගරු මහ ඇමතිතුමා, යූ.එන්.පී. එකට කරන්න ඕනෑ වුණේ ඕක. ඒක තමයි කළේ. මුන්ට ඕනෑ වුණේ ඕක කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෝඩයෝ වාගේ හැසිරෙන්න එපා. ඕක කඩන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනතාවගේ මුදල් ඕවා.

[සභාවේ සෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, විහිළුවක් නේ මේක. ඒක ඕනෑවට කළ වැඩක්.

[සභාවේ සෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අමාරුවෙන් ඕක හැදුවේ. සෙංකෝලයේ තිබෙන වටිනාකම. අපි කොපමණ දුක් වින්දාද? අපට කඳුළු එනවා ඒකට. කොච්චර දුක් වින්දාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැමරාවල දර්ශන තිබෙනවා නේ? මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන් ක්‍රියා මාර්ගයක් ගන්න. නැත්නම් මේක ආදර්ශයක් වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කැත වැඩක් කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

CCTV වල ඇති නේ කැඩුවේ කවුද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අලාභය අය කර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම සභාව විනාඩි 15 කට තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.40 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened until 11.40 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. දැන් මීට මොහොතකට පෙර සිදු වූ අවාසනාවන්ත සිදුවීම පිළිබඳව මම ඉතාමත්ම කනගාටු වෙනවා. මොකද, මම අවුරුදු 24 ක් පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් අවුරුදු පහකුත්, සභාපතිවරයා වශයෙන් මෙ වන කොට අවුරුදු අටක කාලයක් මම මේ තනතුරේ මූලාසනයේ වාඩි වෙලා තිබෙනවා. අද සිදු වූ සිදුවීම ගැන මම ඉතාම කනගාටු වෙනවා .

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කොන්ද පණ නැතිකම. කොන්ද පණ නැතිකම කියලා හිතා ගන්න.

[සභාවේ සෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මෙන්න පිස්සෙක්. මෙන්න පිස්සෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙන්න පිස්සෙක් යනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයේ සංවිධායක පිස්සෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභා රීතිය පාවිච්චි කරලා එළියට දාන්න ඕනෑ.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මූලාසනයට කථා කරන්න ඉගෙන ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. නිශ්ශබ්ද වන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අපි කනගාටු වෙනවා මේ නායකයෝ මේ විධියට හැසිරෙන එකට. මොවුන්ට ඉස්සෙල්ලා මේ සභාවේ හැසිරෙන ආකාරය ගැන Class එකක් දාලා උගන්වන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අගමැතිතුමාට ලියුමක් අරින්න ඕනෑ, සංවිධායකවරයාගේ හැසිරීම ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කනගාටු වීමට සිද්ධි දෙකක් තිබෙනවා. එකක් තමයි, අවුරුදු 24 ක පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක් වශයෙන් අපි කවුරුත් ගරු කරන, කවුරුත් ගරු කරන අපේ සෙංකෝලයට කරපු අගෞරවය පිළිබඳව. සෙංකෝලය කෑලි කෑලිවලට කැඩිලා ගියා. ඒ සිදුවීමට මම ඉතාම කනගාටු වෙනවා. මට ඊට වැඩිය කනගාටුවක් මේ දැන් සිද්ධ වුණා. අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රී යූ. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා මට කොන්ද පණ නැහැයි කියලා කිව්වා. මම දන්නේ නැහැ එතුමා කොහොමද දන්නේ කියලා මගේ කොන්ද පණ නැති විත්තිය. නේද? ඊටත් වඩා මම කනගාටු වෙනවා, අපේ ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් වන අපේ රංජිත් සෝමවංශ ඇමතිතුමා, ඒකට එතුමා මේසයට තට්ටු කරලා සන්තෝෂය පළ කළා. ඒ සිද්ධියට මම ඉතාම කනගාටු වෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු ජෝර්ජ් මන්ත්‍රීතුමා, සමාව ගන්න. කරපු අපහාසයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ නම් මට කමක් නැහැ. නමුත්. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් - ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා එවැනි ප්‍රකාශයක් කරන කොට මේසයට තට්ටු කරලා, ඒ පිළිබඳව සතුට පළ කිරීම ඉතාමත් කනගාටුදායකයි. මම කනගාටු වෙනවා. (බාධා කිරීම්) මම පැත්තක් ගන්නේ නැහැ. මම ස්වාධීනව ඉන්නේ. සමහරු හිතයි, මම පැත්තක් ගන්නවා කියලා. මම ගරු කළේ කණ්ඩායම් රැස්වීමට. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කණ්ඩායම් රැස්වීමේදී තීරණයක් ගත්තා, අපි මේ ගැන සභාවේ මතය විමසමු කියලා. මම ඒකයි සභාවෙන් ඇහුවේ. මම වෙන එකක් මෙතැනදී ඇහුවේ නැහැ. වෙන කාරණාවක් මම ඇහුවේ නැහැ. ඒකයි මම ඇහුවේ. සෙංකෝලය සම්බන්ධව සිදු වීම මම දැක්කා. මට කියන්න පුළුවන්. යම් යම් ඉඟි ආවා, මේකට. සෙංකෝලය දැන් මොනවා හරි - ඒ වාගේ ඉඟි ආවා. මම මෝඩයෙක් නොවෙයි. අවුරුදු විසි හතරක් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් මම. ඒ නිසා මේ ඔක්කොම මම දන්නවා. මේ දේශපාලනය තුළ මමත් මේ තෙම්පරාදු වුණු මනුස්සයෙක්. මම දන්නවා කොහාටද යන්නේ කියලා මේවා. නමුත් මම ස්වාධීනයි. මම පඹයෙකුත් නොවෙයි. කොන්ද පණ නැති මිනිහෙක් නොවෙයි. මට හොඳ කොන්දක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොන්ද නැති අය දඟලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනික් අයට කොන්ද නැති වුණාට. මම පාවා දෙන්නේ නැහැ. තනතුරුවලට පාවා දෙන්නේ නැහැ. අනවශ්‍ය වාසි මම ගන්නේ නැහැ. බලපෑම් කරලා අනවශ්‍ය වාසි ගන්න මිනිහෙක් නොවෙයි.

පුළුවන් නම් මම කරනවා රාජකාරිය. බැරි නම් මම මොකක් හරි තීන්දුවක් ගන්නවා. ඒකත් සභාවේ මතයට ගරු කරලා මම ඒ තීන්දුව ගන්නේ. තනිවම නොවෙයි. ඒ නිසා සෙංකෝලය පිළිබඳව, ඒ වුණු අවාසනාවන්ත සිද්ධිය පිළිබඳව මම - තවම මට හරියට කියන්න බැහැ. මෙතැන මම හිටියාට මට පෙනුනේ නැහැ. ගාලගෝට්ටියක්

නිසා. මම ඒක හරියට කැමරාවලින් බලලා, ඒ සම්බන්ධව ඉදිරියේදී අපේ මහ ඇමතිතුමාත් එක්ක, ඒ වාගේම විපක්ෂ නායකතුමාත් එක්ක අපි පුළුල් සාකච්ඡාවක් කරලා, ඒ ගැනත් තීන්දුවක් ගනිමු. මොකද, මේක මේ මට කරපු අගෞරවයක් නොවෙයි. සෙංකෝලය කියන්නේ වටිනා, පෞරාණික වස්තුවක් මේක. ගරු සභාවේ මීට ඉස්සෙල්ලාත් ඔය වාගේ සිද්ධි ඇති වුණා. සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමාගේ දතකුත් කැඩුණා සෙංකෝලයේ ප්‍රශ්නයක් ඇවිල්ලා. එතුමාගේ දතක් කැඩිලා ගියා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

වන්දි අය කර ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් අපි කලින් ගත් තීරණය අනුව - පොඞ්ඩක් සමා වෙන්න. මම පරක්කු වුණු හේතුව. ඒකත් කියන්න එපැයි. මම මගේ කාමරයට වෙලා පොඞ්ඩක් වාඩි වෙලා හිටියේ. සෙංකෝලය පොඞ්ඩක් ගැට ගහ ගන්න කල් හිටියේ. ඒකයි. මේක කෑලි වලට කැඩිලා නේ තිබුණේ. මේකේ පැලැස්තර දාලා, කෑලි අමුණා ගෙන - පුංචි කැල්ලක් තව තිබෙනවා. ඒකත් අපි පස්සේ හදා ගන්නවා. ඒ නිසයි ප්‍රමාද වුණේ. නැත්නම් වෙන හේතුවක් නිසා මම ප්‍රමාද වුණේ නැහැ. මම සභාවට එන්න ප්‍රමාද වුණේ, මේක පොඞ්ඩක් ගැට ගහලා, අලවලා මේක මෙතැනින් තියනකල්. නැත්නම් සභාව අපට යන්න බැහැ නේ?

මට කනගාටුව ඒක නොවෙයි. මේවාට මම භය නැහැ. ආණ්ඩු පක්ෂයේ මගේ සහෝදර ඇමතිවරයෙක් අත්පුඩි ගැහුවා. මගේ කොන්ද පණ නැහැයි කිව්වාම මේසයට ගැහුවා. විපක්ෂයේ කවුරු හරි කිව්වා නම්, මට දුකක් නැහැ. (බාධා කිරීම්) ඔබතුමාට ඇහෙන්නේ නැහැ ඕවා. ගරු ඇමතිතුමා, මම කනගාටු වෙනවා. එකට පළාත් සභාවට ආපු දෙන්නෙක් අපි. කොන්ද පණ නැහැයි කිව්වාම ඔබතුමා මේසයට ගහනවා. මොකක්ද ඔබතුමාගේ තිබෙන තත්ත්වය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවේ වැඩ කටයුතු -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මේ අවස්ථාවේදී සභාවට පැමිණියා. ඒ නිසා අපි න්‍යාය පත්‍රයට යමු. මම මේ අවසාන වශයෙන් සභාවට ඉදිරිපත් කළේ. ආණ්ඩු පක්ෂය එකතු වෙලා, අපි සියලුම කණ්ඩායම් නායකයින් එකතු වෙලා ගත් තීන්දුව අනුව අපි තීරණය කළා, මේ සභාවේ මතය විමසමු කියලා, අපි විවාදය කල් දානවාද කියන එකට. අපි ඡන්දයකට ගියා. ඒ නිසා මම නැවත වරක් මතක් කරනවා. එම පනත සම්බන්ධව විවාදය කල් තැබීමේ යෝජනාවට බෙදීමක් තිබෙන නිසා ඡන්දය විමසනවා.

[සභාවේ ඝෝෂා]

***ඊට අනුකූලව ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 51 යි, විරුද්ධව 41 යි, වැළකුණු 01 යි යනුවෙන් බෙදුණේය.***

*Accordingly, question put and the Council divided as per Rule No 61 (3), 51 for, 41 against and 01 decliners.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තත්පරයක් දෙන්න කෝ? ඒ එක්කම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රකාශ කළා. මේ පිළිබඳව එතුමා - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තවම පනත සම්මත කළේ නැහැ. වුන් වෙලා ඉන්නේ. පනත සම්මත කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අද උදේ ප්‍රකාශ කළා. මේ සම්බන්ධව එතුමා කල් ඉල්ලීමක් කළා. ආණ්ඩුකාරතුමාගේ ප්‍රකාශය එතුමා ඉදිරිපත් කළා. මේ පිළිබඳව දැන් මොහොතකට පෙර මම මගේ නිල කාමරයේදී ගරු ආණ්ඩුකාරතුමා කථා කරලා, එතුමා මටත් කථා කරලා කිව්වා. ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. එතුමාට හැකියාව තිබෙනවා, මේ ගැන - (බාධා කිරීම්) ගරු ප්‍රධාන අමාත්‍යතුමා උදේ ප්‍රකාශ කළා, වගකීමකින් එතුමා ප්‍රකාශ කළා, මෙම කාරණාව සම්බන්ධයෙන් එතුමා කථා කරලා, මැදිහත් වෙලා, ගරු ආණ්ඩුකාරතුමා එක්ක සාකච්ඡා කළා. එතුමා, වාචිකව පොරොන්දු වෙලා තිබෙනවා. දවස් 14 ක් ලබා දෙන්න. ඒක ප්‍රශ්නයක් නැහැ. කල් අරගෙන දෙන්නම් කියලා තියෙනවා.

ඒ නිසා මේ සභාවේ ඇති වූ මේ සිද්ධිය පිළිබඳව කොහොම හරි මාධ්‍යයෙන් වෙන්න පුළුවන්, මොන යම් හෝ ක්‍රමයකින් එතුමාට යන්න ඇති. එතුමා මට කථා කළා. මගේ නිල කාමරයේදී. එතුමා මට ප්‍රකාශ කළා, එතුමාට එහෙම කල් දෙන්න පුළුවන් කියලා. එතුමා ආණ්ඩුකාරවයා වශයෙන් ජනාධිපති ලේකම්තුමාට කථා කරලා ඒ සම්බන්ධව එතුමාටත් බලය තිබෙනවාය කිව්වා, කල් ගන්න. ඒ නිසයි මම ඒ ප්‍රකාශය කළේ. මේක නිවැරදි වෙන්න ඕනෑ. මේ සභාවේ මොකක්ද වුණේ කියන එක. ඒකයි මම ප්‍රකාශ කළේ. ඒ නිසා මම ආරාධනා කරනවා. ගරු සභානායකතුමාට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. අද මේ සභාවේ උදේ වරුවේ පටන් ගත් අවස්ථාවේදී, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සභාව පවත්වාගෙන යන අවස්ථාවේ කණ්ඩායම් නායකයින්ගේ රැස්වීමක් ඉල්ලීමක් කළේ පැහැදිලි කිරීමක් කර ගන්නය කියලා. මේ සභාව පවත්වාගෙන යන්න ඕනෑ ජනමතය - ඡන්දයක් පවත්වලා කල් දාන්න නොවෙයි ඉල්ලුවේ. එතුමන්ලා පක්ෂ නායකයින්ගේ රැස්වීමේ කථා කරලා, මේ යෝජනාව කල් දානවාද නැද්ද කියන එක සම්බන්ධව තීන්දුවක් අරගෙන තමයි මෙතැනට ඇවිල්ලා ප්‍රකාශ කළේ. ඒ අනුව තමයි මේ ඡන්දය පැවැත්වුවේ. මේක පනත සම්මත කරන එකක් නොවෙයි. නමුත් ගරු සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කරනවා. ඔබතුමා මේ ආණ්ඩුකාරතුමාගේ ලිපිය සභාගත කරලා, ලිපිය කියවලා, අද මේ දවස වෙන් කර ගෙන, වෙලාව වෙන් කර ගෙන මේ සභාව පැවැත්වුවේ මේ පනත සම්මත කරනවාද නැද්ද කියන එක තීන්දු කරන්න. විවාදය දීලා. ඒකට ඡන්දයකින් හරි, ඡන්දය විමසීමකින් එකඟතාවයකට පත් කරන්න තිබෙන මේ අවස්ථාව අද ලබා නොදී මේ සභාව නොමග ඇරීම - කණ්ඩායම් රැස්වීම ඉල්ලපු එක - පක්ෂ නායක රැස්වීම ඉල්ලපු එක නොමග යැවීමක් කියලා අපි සලකනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට සභාවේ එකඟතාවය - මූලාසනය කටයුතු කරන්නේ බහුතර මතයට ගරු කරමින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා, ඔබතුමාගෙන් ඒ වෙලාවේ කල් ගත්තේ කණ්ඩායම් රැස්වීමේ කථා කරන්න -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, මේක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක වරප්‍රසාද ප්‍රශ්නක් නොවෙයි. මේ බහුතර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ න්‍යාය පත්‍රය අනුව අපට වෙනත් කාරණයකට යන්න බැහැ. ඒ නිසා මම සභානායකතුමාට ආරාධනා කරනවා, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. අපි සතියකින් තියලා බලමු මහ ඇමැතිතුමා මොකද වෙන්නේ කියලා. පනත ගෙනැල්ලා බලමු කෝ කවුද අකමැති වෙන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

*ගරු සභාපතිතුමනි,"දැන් මම මෙම සභාව කල් තැබිය යුතු යැයි" යෝජනා කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 11.56 ට, 2017 සැප්තැම්බර් මස 04 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 11.56 a.m till 9.30 a.m. on 04.09.2017*